**කොළඹ අධ්‍යාපන කලාපය**
මධ්‍ය වාර පරීක්ෂණය - 2015
පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

5 වන ශ්‍රේණිය කාලය පැය 02

නම -.......................................................................................................

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

(01) පහත සඳහන් වගන්ති හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද වරහන් තුළ යොදන්න.

1. සමනලයා මධු භක්ෂක සතෙකි. ( )
2. වසංගත රෝග නිසා ආර්ථික වශයෙන් රට පරිහානියට පත්වේ. ( )
3. පක්ෂීන්ට ඇස් හැරවිය නො හැකිය. ( )
4. භූමිකම්පා, සුනාමි තත්ත්ව ඇතිවීමට බලපා ඇත. ( )
5. කොහොඹ බීජ දියරය පරිසර හිතකාමී කෘෂි පාලන දියරයක් නොවේ. ( )
6. ළමා මෙහෙකාර සේවය සමාජ විරෝධී ක්‍රියාවකි. ( )
7. සුළඟේ වේගය මනින උපකරණය වන්නේ සුළං දිශා දර්ශකයයි. ( )
8. ශ්‍රී ලංකා සිතියමක ජලාශ ලකුණු කර ඇත්තේ නිල් පැහැයෙනි. ( )
9. පාංශු ඛාදනය නාය යාමට හේතු වෙයි. ( )
10. මස්, මාළු, කිරි, බිත්තර ශක්ති ජනක ආහාර වේ. ( )

(ලකුණු 10)

(02) "අ" කොටසට ගැළපෙන පිළිතුර" ඊ " කොටසින් තෝරා එයට හිමි අංකය වරහන තුළ යොදන්න.

| "අ" කොටස | | ඊ කොටස |
|---|---|---|
| • ඉතා ඉක්මනින් පැළවෙන බීජයකි. | ( ) | 1. කප්පි |
| • ඕස්ට්‍රේලියාවේ ජාතික සංකේතය | ( ) | 2. අභය වැව |
| • ආහාර නැවත වමාරා කන සතෙකි. | ( ) | 3. සිංහරාජ |
| • අපට නොමිලේ ලැබෙන සේවයකි. | ( ) | 4. අඹ |
| • පණ්ඩුකාභය රජ සාදන ලදී. | ( ) | 5. කැන්ගරු |
| • ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ වනාන්තරයකි. | ( ) | 6. ගවයා |
| • බරක් පහසුවෙන් ඉහළට ගැනීමට භාවිතා කරයි. | ( ) | 7. ගම්පහ |
| • බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්කයකි. | ( ) | 8. අයිස් |
| • ජන්මයෙන් රටකට ආවේණික වූ පැළෑටි හා ගස්වැල් | ( ) | 9. සෞඛ්‍ය |
| • ජලයේ එක් අවස්ථාවකි. | ( ) | 10. ඒක දේශික ශාක |

(ලකුණු 10)

(03) සුදුසු පිළිතුර තෝරා හිස්තැන පුරවන්න.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ක්ලෝරීන් / | ඉන්දියාව / | ශ්‍රී මහා බෝධිය / | සුළි සුළඟ / | සර්පිනාව / | භූ විෂමතාව | |
| ත්‍රිකුණාමලය / | මහන මැෂිම / | ශ්‍රී ලංකාව / | මහා වංශය / | මුස්ලිම් / | දෙමළ | |

1. අනුරාධපුර .................................. ඓතිහාසික වැදගත්කමක් ඇති ශාකයකි.
2. .................................. ආසියා මහද්වීපයේ දකුණු කොටසේ පිහිටා ඇත.
3. ජාතික කොඩියේ කොළපාට තීරුවෙන් .................................. ජන වර්ගය නියෝජනය වේ.
4. ශ්‍රී ලංකාව .................................. අනුව කලාප 3 කට බෙදා ඇත.
5. මහවැලි ගඟ මුහුදට වැටෙන්නේ .................................. නි.
6. .................................. සුළඟින් ක්‍රියාත්මක වන සංගීත භාණ්ඩයකි.
7. .................................. කැස්ටර් වීල් සහිත උපකරණයකි.
8. ස්වභාවික සංසිද්ධියක් වන්නේ .................................. ය.
9. අපේ රටේ ඉතිහාසය ලියවී ඇති ග්‍රන්ථය .................................. වේ.
10. ජලය විශාල ප්‍රමාණයක් පිරිසිදු කිරීමට .................................. යොදා ගනී.

(ලකුණු 10)

(04) නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1) සෞරග්‍රහ මණ්ඩලයේ විශාලතම ග්‍රහයා වනුයේ,
 1. පෘථිවිය 2. සිකුරු 3. බ්‍රහස්පති 4. නෙප්චූන්

2) හාවාගේ ගමන් විලාසය පෙන්වන වන්නම වනුයේ,
 1. තුරඟා 2. හනුමා 3. මුසලඩි 4. ගජගා

3) ශ්‍රී ලංකාවේ මුල්ම රාජධානිය වනුයේ,
 1. පොළොන්නරුව 2. අනුරාධපුරය 3. දඹදෙණිය 4. යාපහුව

4) ශ්‍රී ලංකාවේ නිරිත දිග මෝසම් සුළං හමන කාලය වන්නේ,
 1. මැයි - ජූලි 2. ජනවාරි - මාර්තු
 3. අගෝස්තු - ඔක්තෝබර් 4. නොවැම්බර් - ජනවාරි

5) දේව රූප නෑවීම හෙවත් කුම්බාභිශේතම් යනු කිනම් ආගමේ ආගමික චාරිත්‍රයක් ද?
 1. බෞද්ධ 2. හින්දු 3. ඉස්ලාම් 4. ක්‍රිස්තියානි

6) පෘථිවිය මත ඇති ජලයෙන් මිනිසාට පරිභෝජනය කළ හැකි ප්‍රතිශතය වනුයේ,
 1. 97% 2. 1% 3. 21% 4. 55%

7) රාජ්‍ය ලාංඡනයෙහි රට හා විනය ගරුක ජාතිය ගැන කියවෙන්නේ,
 1. ධර්ම චක්‍රයෙනි 2. කඩුවක් රැගත් පලාපෙති මැද සිටින සිංහයා ගෙනි.
 3. වී කරල් වලිනි 4. පුන්කලසෙනි

8) ශ්‍රී ලංකාවේ ඒක දේශික පක්ෂියකු නොවන්නේ,

1. අළු දෙමලිච්චා　　2. ලංකා සැළලිහිණියා
3. සුදු රෙදි හොරා　　4. හබන් කුකුලා


9) දිය හොල්මන යනු,

1. ජලයේ සිටින මිනිසුන් බය කරන සතෙකුගේ නමකි.
2. වගා කටයුතු සඳහා ජලය ලබා ගන්නා ක්‍රමයකි.
3. වගාවන් ආරක්ෂා කිරීමට භාවිත කරන ඇටවුමකි.
4. වැව් වල දක්නට ලැබෙන අංගයකි.

10) කැටයම් වලට ප්‍රසිද්ධියක් උසුලන ස්ථාන දෙකකි.

1. ඉසුරුමුණිය හා ශ්‍රී පාදය　　2. ඇම්බැක්කේ දේවාලය හා සීගිරිය
3. යාපහුවේ දළදා මාළිගාව හා ඇම්බැක්කේ දේවාලය　　4. රුවන්වැලි සෑය හා මිරිසවැටිය

11) පහත දැක්වෙන තරු රටාව කුමක් ද?



1. හත්දින්නක් තරු
2. ගෝනුස්සා
3. මහ වලසා
4. නඟුල

12) ලොරියකට බැරලයක් පැටවීම පහසු කර ගැනීමට යොදා ගත හැක්කේ,

1. කප්පිය　　2. ආනත තලය　　3. ගුරු රෝදය　　4. කැස්ටර් වීල්

13) ජලයෙන් බෝවෙන රෝගයක් නොවේ.

1. කොළරාව　　2. ජලභීතිකාව　　3. උණසන්නිපාතය　　4. පාචනය

14) කෘෂිකාර්මික කටයුතු වලට හිතකර සතෙකි.

1. ගොළුබෙල්ලා　　2. ගෙම්බා　　3. මීයා　　4. ගිරවා

15) බාල තේ කොළ වල ලක්ෂණයක් වන්නේ,

1. සිසිල් ජලයට දැමූ විට තද දුඹුරු පැහැවේ.　　2. උණු ජලයට දැමූ විට කහට පාටවේ.
3. සිසිල් ජලයට දැමූ විට පාට නොවේ.　　4. උණු ජලයට දැමූ විට පාටක් ඇති නොවේ.

(ලකුණු 2 x15 = 30)

(05) පිළිතුරු ලියන්න.

1. ආර්ටික වාසි ඇති සතුන් දෙදෙනෙක්

1. ................................................　　2. ................................................

2. එදිනෙදා ජීවිතයේ චුම්බක භාවිත කර ගන්නා අවස්ථා 2 ක්

1. ..................................................

2. ..................................................

3. ඇති රෝද යොදා ඇති උපකරණ 2 ක්

1. ..................................................

2. ..................................................

4. ආහාර කල්තබා ගැනීම සඳහා අතීතයේ භාවිතා කළ ක්‍රම 2 ක්

1. .................................................. 2. ..................................................

5. ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනයට දායක වන ආයතන 2 ක්

1. .................................................. 2. ..................................................

6. බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්ක 2 ක්

1. .................................................. 2. ..................................................

7. ජලය හා බැඳුණු සාම්ප්‍රදායික සිරිත් 2 ක්

1. ..........................................................................................

2. ..........................................................................................

8. ජලය දූෂණය වන ක්‍රම 2 ක්

1. ..........................................................................................

2. ..........................................................................................

9. සමාජ යහපැවැත්මට අදාළ උපදේශාත්මක කවි ගී ඇතුළත් ග්‍රන්ථ 2 ක්

1. ..................................................

2. ..................................................

10. අපේ රටට විශාල සේවයක් කළ රජවරු දෙදෙනෙක්


1. ..................................................

2. ..................................................

(ලකුණු2 x 10 = 20)

(06) පහත රූප සටහන් නම් කරන්න. (ලකුණු 3 x 4 = 12)


(i) (ii) (iii) (iv)



(i)............................ (ii)......................... (iii).........................(iv).......................

(07) පහත රූප සටහන හා එහි කොටස් නම් කරන්න.

.................................................................



(i)............................

(ii)..........................

(iii).........................

(ලකුණු 2 x 4 = 08)